සිංහල පරිවර්තනය

# උතුරු පළාත් තාක්ෂණවේදී සේවයට අයත් නිලධාරීන් (සිවිල්) III වන ශ්‍රේණිය හා තාක්ෂණවේදී සේවයට අයත් නිලධාරීන් (සිවිල් ) හා කෙටුම්පත්කරුවන් පුහුණු ගණයේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2020

උතුරු පළාත් තාක්ෂණවේදී සේවයට අයත් නිලධාරීන් (සිවිල්) III වන ශ්‍රේණිය හා තාක්ෂණවේදී සේවයට අයත් නිලධාරීන් (සිවිල්) හා කෙටුම්පත්කරුවන් යන තනතුරුවලට උපලේඛන–I හි දක්වා ඇති පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් **2020 දෙසැම්බර් මාසය වන විට** පැවැත්වීට නියමිත බව මෙයින් දැනුම් දෙනු ලැබේ. 09.12.2020 අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය වේ

- **උපලේඛනය –I**

<table>
<tr><th>අංක</th><th>විභාගයේ නම</th><th>විභාග අංකය</th><th>පුරප්පාඩු සංඛ්‍යාව</th></tr>
<tr><td>01</td><td>උතුරු පළාත් තාක්ෂණවේදී සේවයේ තාක්ෂවේදී නිලධර (සිවිල්) III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2020</td><td>01</td><td rowspan="2">12</td></tr>
<tr><td>02</td><td>උතුරු පළාත් තාක්ෂණවේදී සේවයේ තාක්ෂවේදී නිලධර (සිවිල්) පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2020</td><td>02</td></tr>
<tr><td>03</td><td>උතුරු පළාත් තාක්ෂණවේදී සේවයේ කෙටුම්පත්කරු පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය – 2020</td><td>03</td><td>03</td></tr>
</table>

## 02. බඳවා ගැනීමේ සේවා කොන්දේසි :-

02.1 **01.06.2013** වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි උතුරු පළාතේ ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද උක්ත තනතුරු සඳහා පළාත් තාක්ෂණවේදී සේවයට අදාළ සේවා ව්‍යවස්ථා සංග්‍රහය හා බඳවා ගැනිම් පරිපාටියේ නියම කරන ලද කොන්දේසීන් හා ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට ද, මුදල් රෙගුලාසීන් හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක **1817/30** දරණ **2013.07.03** දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා වූ ආයතන කාර්ය පටිපාටි සංග්‍රහයට ද අනුකූල වන අතර ර්ට යටත්ව, විවෘත තරඟ විභාගය මඟින් තෝරා ගන්නා විභාග අපේක්ෂකයන් **උපලේඛන –I** හි දක්වා ඇති තනතුරු වල III වන ශ්‍රේණියට හා පුහුණු ශ්‍රේණියට පත් කරනු ලැබේ.

02.2 තාක්ෂවේදී නිලධර (සිවිල්) IIIවන ශ්‍රේණියේ තනතුරට විවෘත තරඟ විභාගය මඟින් පත්වීම සඳහා තේරිපත් වන විභාග අපේක්ෂකයන් පත්වීම ලද දින සිට වසර තුනක (03) පරිවාස කාලයට යටත් කර එම පදනම මත තනතුරට පත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකි.

02.3 විවෘත තරඟ විභාගය මඟින් පුහුණු ශ්‍රේණියට තෝරාපත් කර ගන්නා විභාග අපේක්ෂකයන් තාක්ෂණවේදී සේවයේ නිලධර (සිවිල්) හා කෙටුම්පත්කරුවන් යන තනතරට පුහුණු ශ්‍රේණියට පත් කරනු ලැබේ. මෙම අභ්‍යාසලාභීන් වසරක පුහුණු කාලය තෘප්තිමත් පරිදි අවසන් කළ පසු සුදුසුකම් පරීක්ෂා කිරීමේ විභාගයට පෙනී සිටිය යුතුයි. මෙම විභාගයෙන් සමත් වන අපේක්ෂකයන්ට පමණක් III වන ශ්‍රේණියට පත්වීම් ප්‍රදානය කරනු ලැබේ. පුහුණුව අවසානයේ දී පැවැත්වෙන පරීක්ෂණයෙන් සමත්වීමට අපොහොසත් වන අපේක්ෂයන්ට, ඔවුන්ගේ පුහුණු කාලය **මාස හයකට (06)** සීමා කොට දීර්ඝ කිරීමටප අවස්ථාවක් දෙනු ලැබේ. දීර්ඝ කරන ලද පුහුණු කාලය අවසානයේදී නැවත පැවැත්වෙන විභාගයෙන් සමත් නොවූ අභ්‍යාසලාභීන්ගේ සේවය අවසන් කරනු ලැබේ.

02.4 මෙම සේවය ස්ථානමාරුවලට අයත් සේවයක් වන අතර මෙම සේවය සඳහා පත්වීම් ලබන්නන් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුයි. මෙය කොන්දේසියක් වන අතර එම කොන්දේසියට පත්වීම් ලබන්නන් යටත් විය යුතුයි.

02.5 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා මෙයට අනුකූලව වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛයන් ප්‍රකාරව පත්වීම් දින සිට වසර **පහක් (05)** අවසන්වීමට ප්‍රථම නියම කර ඇති දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය ලබා ගත යුතුයි.

02.6 පත්වීම් සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය යන තොරතුරු පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ. පත් කිරීමට නියමිත සංඛයාව උපලේඛන –I හි දක්වා ඇති පරිදි වේ. එසේ වූවද දැන්වීමේ සඳහන් පුරප්පාඩු සම්බන්ධයෙන් යම් පුරප්පාඩු හෝ සියළුම පුරප්පාඩු පූර්ණය නොකර සිටීමේ බලය පත්වීම් බලධාරියා සතුය.

## 03. වැටුප් පරිමාණය :-

**03.1 පළාත් තාක්ෂණවේදී සේවයේ තාක්ෂණ නිලධාරී (සිවිල්) III වන ශ්‍රේණියේ තනතුර සඳහා :-**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ප්‍රකාර වැටුප් කාණ්ඩය **MN 3 – 2016** ට අනුව **උපලේඛන - I** හා සඳහන් කරන ලද තනතුරු වල III වන ශ්‍රේණිය සඳහා ශුද්ධ වැටුප් ප්‍රතිශතය **රුපියල් 31,040 – 10 x 445 - 11 x 660 - 10 x 730 – 10 x 750 – 57,550/-** වේ. (රුපියල් 32,375/- යන වැටුප් පියවරට ප්‍රථම I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතුයි) එසේ වුව ද ඉහත චක්‍රලේඛයේ **උපලේඛන – II** හි දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව වැටුප් ගෙවනු ලැබේ.

**03.2** පළාත් තාක්ෂණවේදී සේවයේ තාක්ෂණ නිලධාරී (සිවිල්) හා කෙටුම්පත්කරු **පුහුණු ශ්‍රේණියේ තනතුරු සඳහා:-**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ප්‍රකාර, එම චක්‍රලේඛයේ උපලේඛන- **V** හි දක්වා ඇති විධිවිධානයන්ට අනුව **රුපියල් 27,140.00** ක් මාසිකව ගෙවනු ලැබේ.

## 04. සාමාන්‍ය සුදුසුකම් :-

04.1 අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුයි.

04.2 අයදුම්කරු උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු පරිදි ශාරීරික නිරොගිතාවයකින් යුතු පුද්ගලයකු විය යුතුයි. එමෙන්ම මනා චරිතයක් හා යහපත් හැසිරීමක් ඇති පුද්ගලයකු විය යුතුයි.

04.3 අ) අයදුම්කරු උතුරු පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුයි. මෙම අයදුම්පත කැඳවීම් අවසාන දිනට ප්‍රථම **වසර (06)** ක කාලපරිච්ඡේදය තුළ අවම වශයෙන් **වසර (03)** ක් හෝ උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවකු විය යුතුයි.

**හෝ**

ආ) අයදුම්කරු හෝ අයදුම්කරුගේ දෙමාපියන් උතුරු පළාතේ උපත ලබා තිබිය යුතු අතර අවම වශයෙන් **වසර (05)** හෝ උතුරු පළාතේ අඛන්ඩ පදිංචිකරුවන් විය යුතුයි. **(සම්මුඛ පරීක්ෂණයේ දී ස්ථිර පදිංචිය සනාථ කිරීමට සඳහා ඡන්ද නාම ලේඛණයේ සහතික කරන ලද පිටපත ඉදිරිපත් කළ යුතුයි)**

04.4 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට (09.12.2020) හෝ ඊට ප්‍රථම මෙම තනතුරට කැඳවන ලද **සියළුම සුදුසුකම්** අයදුම්කරු විසින් සපුරා තිබිය යුතුයි.

04.5 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට (09.12.2020) අයදුම්කරුගේ **වයස අවුරුදු 18 ට නොඅඩු, වයස අවුරුදු 30 ට නොවැඩි** විය යුතුයි.

## 05. අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් :-

එක් එක් තනතුර සඳහා වූ අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් මෙම දැන්වීම් **උපලේඛන–II** හි දක්වා ඇත. අයදුම් කරන සියලුම අයදුම්කරුවන් තම සුදුසුකම්වලට වඩාත් උචිත තනතුරු සඳහා පමණක් අයදුම් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. මෙම අයදුම්පත භාරගන්නා අවසාන දිනට හෝ ඊට ප්‍රථම කැඳවා ඇති සියළුම සුදුසුකම් අයදුම්කරු සම්පූර්ණ කර තිබිය යුතු අතර ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින අතරතුර ඉදිරිපත් කරන සියළුම අයදුම්පත් පෙර දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

## 06 බඳවා ගැනීමේ ක්‍රමවේදය :-

06.1 ලිඛිත පරීක්ෂණය මගින් හා හැකියාව පදනම් කරගෙන බඳවා ගන්නා අවස්ථාවේදී බල්ගැන්වී ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, බඳවා ගැනීම් පටිපාටීන්, ජාතික හා පළාත ප්‍රතිපත්තීන් යනාදීන්ට අනුකූලව **උපලේඛන–I** හි සඳහන් තනතුරුවලට බඳවා ගනු ලැබේ. මෙම දැන්වීම මගින් කැඳවා ඇති සුදුසුකම් සියල්ල සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂාවට ලක් කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් නැතිබවට තිරීක්ෂණය වුවහොත් මෙම තනතුරු සඳහා ඇති හිමිකම් සියල්ල අවලංගු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී සුදුසුකම් හා ලියකියවිලි පරීක්ෂා කරනු ලැබේ. මෙම ක්‍රියාවලියේදී ලකුණු ප්‍රදානය කරනු නොලැබේ.

06.2 ඉහත සුදුසුකම් සියල්ල ලබා ඇති අයදුම්කරුවන්ගෙන්, ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන විභාග අපේක්ෂකයන් තාක්ෂණ නිලධාරි සේවයේ බඳවා ගැනීමේ පටිපාටියේ 7.2.3 වගන්තියේ V(ii) උපවගන්තියට අනුව ලබාගත් සම්පූර්ණ ලකුණුවලින් පළාත් මට්ටමින් ලබා ගන්නා ඉහළ ලකුණු පිළිවෙල අනුව, පවතින පුරප්පාඩුවලට අනුකූලව පත්වීම සඳහා සම්මුඛ පරීක්ෂණයට තෝරා ගනු ලැබේ.

06.3 තාක්ෂණ නිලධාරි (සිවිල්) තනතුරේ III වන ශ්‍රේණියට සෘජුවම බඳවාගනු ලැබේ. බඳවාගනු ලබන ශ්‍රේණිය වනුයේ තාක්ෂණ නිලධාරි (සිවිල්) III වන ශ්‍රේණියට සෘජුවම බඳවා ගැනීමට සුදුසුකම් ලත් අයදුම්කරුවන් අවශ්‍ය ප්‍රමාණයක් නැති විටකදී පමණක් පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීම සම්බන්ධයෙන් තීරණය කරනු ලැබේ. කෙටුම්පත්කරුවන් සඳහා වූ පුරප්පාඩුවට බඳවා ගනු ලබන්නේ පුහුණු ශ්‍රේණියටය.

06.4 පුරප්පාඩුවලින් 03% ක් විශේෂ අවශ්‍යතාවයන් (ආබාධිත) ඇති අපේක්ෂකයන් සඳහා වෙන්කරනු ලැබේ. විභාග අපේක්ෂකයන් පත්වීම සඳහා තෝරාපත් කරගන්නා විට අදාළ තනතුරේ සේවය කිරීමට තම විශේෂ අවශ්‍යතාවය (Disability) බාධාවක් නොවන බවට වෛද්‍ය පරීක්ෂණ වාර්තා මගින් සනාථ කළ යුතුයි. නමුත් විශේෂ අවශ්‍යතාවයන් ඇති විභාග අපේක්ෂකයකු පත්වීම සඳහා සුදුසුකම් ලන්නේ ලිඛිත විභාගයට අවශ්‍ය ලකුණු ලබා ගන්නා පදනම මතයි.

## 07. විභාග ගාස්තු :-

අයදුම්කරුවන් තමන් පදිංචි උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක රුපියල් **500.00** ක් වටිනා මුදල **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** ගේ **"3401"** යන තැන්පත් ගිණුමට තැන්පත් කර කුවිතාන්සිය අයදුම්පතේ අදාළ කොටුව තුළ නොගැලවෙන සේ ඇලවිය යුතුයි. හේතුව කුමක් වුවත් මෙම ගාස්තුව නැවත ගෙවීම් කරනු නොලැබේ එමෙන්ම මෙම ගාස්තුව වෙනත් විභාගයන් සඳහා මාරු කර ගැනීමට අනුමත කරනු නොලැබේ.

## 08. අයදුම්කරන ක්‍රමවේදය :-

08.1 මෙම දැන්වීම මගින් දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුකූලව A4 ප්‍රමාණයේ (සෙ.මී21 x 29සෙ.මී) කඩදාසියක 1 සිට 10 දක්වා තිබෙන ඡේද පළමු කොටසටද 11 සිට 14 දක්වා ඇති ඡේද දෙවන පිටුවටද ඉතිරි කොටස් අනෙක් පිටුවේ ද ඇතුළත් වන පරිදි අයදුම්පත සකස් කළ යුතුයි.. සම්පූර්ණ කරන ලද අයදුම්පත **09.12.2020** දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ, **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක :393/48, කොවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

08.2 එක් තනතුරකට වඩා වැඩි තනතුරුවලට අයදුම් කිරීමට සුදුසු අපේක්ෂකයන් එම අයදුම්පත් **වෙන වෙනම සකස් කර සම්පූර්ණ කිරීමෙන් අනතුරුව යොමු කළ යුතුයි** එමෙන්ම **විභාග ගාස්තුද වෙන වෙනම ගෙවිය යුතුයි.**

08.3 අයදුම්පත්‍ර යොමු කරන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ **"උතුරු පළාත් තාක්ෂණ සේවයට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා වූ අයදුම්පත–2020"** යනුවෙන් සඳහන් කළ යුතුයි. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසු ලැබෙන අයදුම්පත් හා අවශ්‍ය තොරතුරු සම්පූර්ණ කර නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08.4 අයදුම්පත්‍රයේ ඡායා පිටපත තමා ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. අයදුම්පත්‍රයේ ඡායා පිටපත හා පූර්ව නිශ්චිත පිටපත යනාදිය පිළිගන්නේ නැති අතර විභාග ප්‍රවේශපත්‍ර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් යථා කාලයේදී එවනු ලැබේ. විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම මගින් අයදුම්කරුහට අවශ්‍ය සියළුම සුදුසුකම් ඇති බවට පිළිගැනීමක් නොවන බව සැලකිල්ලට ගත යුතුයි.

08.5 අයදුම්පත් ඉදිරිපත් කර ඇති සුදුසුකම් ඇති අපේක්ෂකයන් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම පුවත්පත් මගින් දැන්වීමක් පළ කරනු ලැබේ. දැන්වීම නිකුත් කිරීමෙන් අනතුරුව කිසියම් අපේක්ෂකයකුට විභාග දිනට අවම වශයෙන් දින **තුනකට(03)** ප්‍රථම හෝ විභාග ප්‍රවේශපත්‍ර ලැබුණේ නැතිනම් පහත සඳහන් තොරතුරු සමග **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක: 393/48, කොවිල් වීදිය, නල්ලූර්, යාපනය්"** යන ලිපිනයට දැන්වීමට පියවරගත යුතුයි. (දුරකථන අංකය -021 221 9939, ෆැක්ස් අංකය -021 221 9940)

**සම්බන්ධ වන විට ඉදිරිපත් කළ යුතු තොරතුරු :-**

**තොරතුරු සඳහන් ලිපිය, අයදුම්පතේ ඡායා පිටපත හා විභාග ගාස්තුගෙවන ලද කුවිතාන්සියේ සහතික කරන ලද පිටපත්. ප්‍රවේශපත්‍ර යොමු කිරීමට ෆැක්ස් අංකයක්.**

08.6 විභාගයට අයදුම් කරන විභාග අපේක්ෂකයන්ට එම අයදුම්පත් ලැබුණු බවට කිසිදු දැන්වීමක් යොමු කරනු නොලැබේ එමෙන්ම අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට ප්‍රථම කැඳවා ඇති සුදුසුකම් සම්පූර්ණ කර නැති අයදුම්පත් පෙර දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**09.අනන්‍යතාවය ඔප්පු කිරීම :-**

විභාග අපේක්ෂකයන් තමා පෙනී සිටින සෑම විෂයයකටම විභාග ශාලාධිපති තෘප්තිමත් වන පරිදි තම අනන්‍යතාවය ඔප්පු කළ යුතු බව ඉල්ලා සිටිනු ලැබේ. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් කුමක් හෝ එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුයි.

(i) පුද්ගලයින් ලියාපදිංචි කරන දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ii) වලංගු ගුවන් ගමන් බලපත්‍රය (Passport)

(iii) වලංගු රියදුරු බලපත්‍රය (Driving License)

ඉහත දක්වා ඇති ලියකියවිලිවලින් කුමක් හෝ එකක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් විභාගයට පෙනී සිටීමේ හිමිකම අහිමි කිරීමේ බලය **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත,"** විසින් තම අභිමතය පරිදි සිදු කළ හැකි හිමිකම ඇත. විභාග පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් නියම කරන නීතිරීති වලට විභාග අපේක්ෂකයන් නැඹුරු විය යුතුයි.

**10. අසත්‍ය තොරතුරු සඳහා දඬුවම් :-**

අයදුම්පත් සම්පූර්ණ කරන විට දැඩි අවධානයකින් යුතුව නිවැරදි තොරතුරු සැපයීමට වගබලාගත යුතුයි. මෙම විභාගයේ නීතිරීති වලට එකඟව කිසියම් අයදුම්කරුවකු විභාගයට ප්‍රථම හෝ විභාගය පැවැත්වෙන අවස්ථාවේදී හෝ විභාගය අවසන් වූ පසුව හෝ සුදුසුකම් නැති අයකු බවට තහවුරු වුවහොත් ඔහුට හිමි විභාග අපේක්ෂකත්වය එම අවස්ථාවේදීව අවලංගු කරනු ලැබේ. අයදුම්කරුවකු සපයා ඇති කුමක් හෝ තොරතුරක් අසත්‍ය බවට පත්වීම් ලබා දීමෙන් පසු තහවුරු වුවහොත් පළාත් රාජ්‍ය සේවයෙන් ඉවත් කිරීමට පියවර ගනු ලැබේ.

**11. අත්සන සහතික කිරීම :-**

**සෑම අයදුම්කරුවකුම තම අත්සන සහතික කර ගැනීම අනිවාර්ය කටයුත්තකි.** රජයේ ආයතනයක් මගින් අයදුම් කරන අයදුම්කරු තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවට අත්සන් කිරීමට බලය ලත් මගින් සහතික කර ගත යුතුයි. අනෙක් අයදුම්කරුවන් තම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි, සාම විනිසුරු, දිවුරුම් ප්‍රකාශක නිලධාරි, නීතිඥ, නොතාරිස්, නාවික හමුදා, යුද හමුදා, ගුවන් හමුදාවේ අණදෙන නිලධාරි, රුපියල් 498,960.00 ට නොඅඩු වටිනාකමින් යුත් වැටුප් ලබන රජයේ හෝ පළාත් පාලන හෝ පළාත් සභා නිලධාරියකු හෝ ආගමික නිකායන් භාරව කටයුතු කරන පූජකයන් යන අයගෙන් කෙනෙකු අත්සන සහතික කළ යුතුයි.

**12. විෂය නිර්දේශය :-**

**12.1 උතුරු පළාත් තාක්ෂණවේදී සේවයට අයත් සිවිල් III වන ශ්‍රේණිය හා පුහුණු ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම**

මෙම ලිඛිත විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර දෙකකින්(02) සමන්විත වන අතර මෙම විභාගය දෙමළ හා සිංහල යන භාෂා මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අයදුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවස්ථාව නොලැබේ මෙම විභාගයෙන් සමත් නොවන කිසිදු අපේක්ෂකයකුට ප්‍රශ්න පත්‍ර නැවත සමීක්ෂණ කටයුතු සඳහා විධිවිධානයන් කිසිවක් යොදා නැත.

| අංකය | ප්‍රශ්නපත්‍ර | ප්‍රශ්නපත්‍රයේ අන්තර්ගතය | කාලය | සම්පූර්ණ ලකුණු |
|---|---|---|---|---|
| 01. | අභියෝග්‍යතා පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය විවේචනාත්මක කරුණු කෙරෙහි විභාග අපේක්ෂකයන් ප්‍රවේශ වන ආකාරය හා හැකියාව, තීරණාත්මක හැකියාව හා විශ්ලේෂණ කිරීමේ හැකියාව යනාදිය අගැයීම සඳහා සකස් කරන ලද ප්‍රශ්නපත්‍රයකි. | පැය 01 . | 100 |
| 02. | තාක්ෂණවේදය හා සබැඳි පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය අයදුම්කරුගේ ඉදිකිරීම් පිළිබඳ මූලික දැනුම, ඉදිකිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය, ගොඩනැගිම් කටයුතුවලට අවශ්‍ය කෙටුම්පත් (Plan) | පැය 03 . | 100 |

| | | | | |
|---|---|---|---|---|
| | | සකස් කිරීම හා කෙටුම්පත (Plan) තේරුම් ගන්නා ආකාරය, මැනීම්, පදනම්, පස් වර්ගය, වීදි නිර්මාණය හා නඩත්තුව, ඇස්තමේන්තු සකස් කිරීම, ජල සැපයුම, කාණු සැකසීම හා කසල ඉවත් කිරීම යනාදි කටයුතුවල දැනුම ඇගයීම සඳහා සකස් කරන ලද ප්‍රශ්නපත්‍රයකි. | | |

12.2 **තුරු පළාත් තාක්ෂණවේදී සේවයට අයත් තාක්ෂණ නිලධාරී සේවයේ කෙටුම්පත්කරු (Draughtsman) පුහුණු ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම**

මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර දෙකකින්(02) සමන්විත වන අතර. දෙමළ හා සිංහල යන භාෂා මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අයදුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවස්ථාව නොලැබේ එමෙන්ම මෙම විභාගයෙන් සමත් නොවන කිසිදු අපේක්ෂකයකුට ප්‍රශ්න පත්‍ර නැවත සමීක්ෂණ කටයුතු සඳහා විධිවිධානයන් කිසිවක් යොදා නැත..

| අංකය | ප්‍රශ්නපත්‍ර | ප්‍රශ්නපත්‍රයේ අන්තර්ගතය | කාලය | සම්පූර්ණ ලකුණු |
|---|---|---|---|---|
| 01. | අභියෝගයතා පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය විවේචනාත්මක කරුණු කෙරෙහි විභාග අපේක්ෂකයන් ප්‍රවේශ වන ආකාරය හා හැකියාව, තීරණාත්මක හැකියාව හා විශ්ලේෂණ කිරීමේ හැකියාව යනාදිය අගයීම සඳහා සකස් කරන ලද ප්‍රශ්නපත්‍රයකි. | පැය 01 | 100 |
| 02. | තාක්ෂණවේදය හා සබැදි පරීක්ෂණය | අයදුම්කරුගේ ඉදිකිරීම් පිළිබඳ මූලික දැනුම, පරිමාණ සැලැස්මට අනුව ඇඳීම, කෙටුම්පත් සම්බන්ධයෙන් තේරුම් ගන්නා ආකාරය, ඉදිකිරීම් හා නිර්මාණකරණය සම්බන්ධ මූලික දැනුම, බිම් ව්‍යුහය විනුම් විද්‍යාත්මක මූලික දැනුම, අංක ගණිතය හා යාන්ත්‍රික විද්‍යාත්මක සිතියම් සම්බන්ධ දැනුම සම්බන්ධයෙන් දැනුම අන්තර්ගත හැකියාව ඇගයීමේ ප්‍රශ්න පත්‍රයකි மற்றும் இயந்திரவியல். | පැය 03 | 100 |

**සටහන** :-

මෙම විභාගය තරඟ විභාගයක් වන බැවින් සම්මුඛ පරීක්ෂනයට සුදුසුකම් ලැබීමට සෑම අපේක්ෂකයන් විසින්ම වෙන් කර ඇති ලකුණු වලින් අවම වශයෙන් සීයයට හතලික ප්‍රතිශතයක් (40%) ලබාගත යුතුයි සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් මෙම තරඟ විභාගයෙන් ලබාගන්නා මුළු ලකුණු ප්‍රමාණයෙන් පළාත් මට්ටමින් ලබා ගත් ඉහළ ලකුණු පිළිවෙළ සැලකිල්ලට ගෙන කටයුතු කරනු ලැබේ.

13. විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් www.np.gov.lk යන උතුරු පළාත් සභාවේ අන්තර්ජාලය මගින් නිකුත් කරනු ලැබේ. අනතුරුව විභාගයට පෙනී සිටි සෑම විභාග අපේක්ෂකයන්ටම තැපැල් මගින් යොමු කරනු ලැබේ.

14. මෙම විභාගය පැවැත්වීමප හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් වූ බලය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් සතුය. මෙම දැන්වීම දෙමළ හා සිංහල මාධ්‍යයන් මගින් පළ කර ඇති අතර භාෂා පාඨයන් අතර යම් කිසි අනනුකූලතාවයක් පැන නගින අවස්ථාවක දී දෙමළ භාෂා මාධ්‍යයේ නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ தமிழ் மற்றும் சிங்களம் ஆகிய மொழி உரைகளுக்கிடையில் ஏதேனும் வேறுபாடு காணப்படும் பட்சத்தில் தமிழ் மொழி உரையே மேலோங்குதல் வேண்டும்.

15. මෙම විභාග දැන්වීම www.np.gov.lk යන උතුරු පළාත් සභාවේ අන්තර්ජාලයට පිවිස ලබා ගත හැකිය.

***එස්. තිරුවාකරන්***
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත.
09.11.2020

# උපලේඛනය –II
## අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්

| අංකය | තනතුරු නාමය | අධ්‍යාපන සුදුසුකම් | වෘත්තීය සුදුසුකම් |
|---|---|---|---|
| 01 | තාක්ෂණ නිලධාරී (සිවිල්) III ශ්‍රේණිය | අපොස (සා/පෙ) විභාගයෙන් එකවර භාෂාව (දෙමළ / සිංහල / ඉංග්‍රීසි), ගණිතය, විද්‍යාව යන විෂයන් ඇතුලුව විෂයන් හතරකට විශිෂ්ඨ සම්මාන සමග විෂයන් හයක් සමත්වී තිබිය යුතුයි.<br><br>**ඒ සමග**<br><br>අපොස (උ/පෙ) විභාගයෙන් ගණිතය විෂයමාලාවෙන් ශුද්ධ ගණිතය/ ව්‍යවහාරික ගණිතය/ සමාන්තර ගණිතය සමග භෞතික විද්‍යාව යන විෂයයන් ඇතුළුව විෂයන් තුනක් එකවර සමත්වී තිබිය යුතුයි | (1) මොරටුව විශ්ව විද්‍යාලයේ හෝ අම්පාර හාඩි තාක්ෂණ ආයතනයෙන් ප්‍රදානය කරන ලද ජාතික තාක්ෂණ ඩිප්ලෝමා (සිවිල්) සහතිකය.<br><br>**හෝ**<br>(2) ජාතික පුහුණු හා වෘත්තීය පුහුණු අධිකාරිය මගින් ප්‍රදානය කරන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (සිවිල්) සහතිකය<br>**හෝ**<br>(3) උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ප්‍රදානය කරන ලද ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමා (සිවිල්) සහතිකය.<br>**හෝ**<br>(4) අනුමැතියලත් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් ප්‍රදානය කරන ලද තාක්ෂණවේදී ඩිප්ලෝමා සහතිකය<br>**හෝ**<br>(5) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් (IESL) පැවැත්වෙන ඉංජිනේරු විභාගයෙන් පළමු කොටස සම්පූර්ණ කර තිබිය යුතුයි.<br>**හෝ**<br>(6) තාක්ෂණ නිලධාරී (සිවිල්) ක්ෂේත්‍රය සම්බන්ධයෙන් එන්වීකියු (NVQ) මට්ටම 6 සම්පූර්ණ කර තිබිය යුතුයි<br>**හෝ**<br>(7) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඉහත සඳහන් කරන ලද තක්ෂණවේදී සහතික නිකුත් කරන ආයතනයකින් අදහස් ලබා ගත් පසු ඉහත තක්ෂණවේදී සුදුසුකමට සෑම ආකාරයෙන්ම සමානතාවයකින් යුත් තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙන් විසින් අනුමැතිය ලබා දෙන වෙනත් සුදුසුකම් |
| 02 | තාක්ෂණ නිලධාරී (සිවිල්) පුහුණු ශ්‍රේණිය **(පුහුණු කාලය වසර 01 කි)** | අපොස (සා/පෙ) විභාගයෙන් එකවර භාෂාව (දෙමළ / සිංහල / ඉංග්‍රීසි), ගණිතය, විද්‍යාව යන විෂයන් ඇතුලුව විෂයන් හතරකට විශිෂ්ඨ සම්මාන සමග විෂයන් හයක් සමත්වී තිබිය යුතුයි.<br><br>**ඒ සමග**<br><br>අපොස (උ/පෙ) විභාගයෙන් ගණිතය විෂයමාලාවෙන් ශුද්ධ ගණිතය/ ව්‍යවහාරික ගණිතය/ සමාන්තර ගණිතය සමග භෞතික විද්‍යාව යන විෂයයන් ඇතුළුව විෂයන් තුනක් එකවර සමත්වී තිබිය යුතුයි | 1. තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙන් අනුමත තාක්ෂණවේදී විද්‍යායතනයේ ජාතික තාක්ෂණවේදී සහතිකය (NCT) (සිවිල්) ලබා තිබිය යුතුයි.<br>**හෝ**<br>2. තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙන් අනුමත කරන ලද තාක්ෂණවේදී විද්‍යායතනයේ වෘත්තිය ක්ෂේත්‍රයේ ඇති සුදුසු තනතුරට ජාතික සහතික පාඨමාලාව (NCC) (සිවිල්) තෘප්තිමත් ලෙස හදාරා සහතික හිමි කර තිබීම්.<br>**හෝ**<br>3. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඉහත සඳහන් තාක්ෂණවේදී සහතික නිකුත් කරන ආයතනයකින් අදහස් ලබා ගත් පසුව ඉහත තාක්ෂණවේදී තාක්ෂණවේදී සුදුසුකම් වලට සියලුම ආකාරයෙන් සමානතාවයකින් යුත් තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද වෙනත් සුදුසුකම් |
| 03 | කෙටුම්පත්කරු පුහුණු ශ්‍රේණිය **(පුහුණු කාලය වසර 01 කි)** | අපොස (සා/පෙ) විභාගයෙන් එකවර භාෂාව (දෙමළ / සිංහල / ඉංග්‍රීසි), ගණිතය, විද්‍යාව යන විෂයන් ඇතුලුව විෂයන් හතරකට විශිෂ්ඨ සම්මාන සමග විෂයන් හයක් සමත්වී තිබිය යුතුයි.<br>.<br>**ඒ සමග** | 1. තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද තාක්ෂණවේදී විද්‍යායතනයකින් වසරක කෙටුම්පත් පූර්ණ කාලීන පාඨමාලාව තෘප්තිමත් ලෙස හදාරා සහතික පත් ලබා තිබීම්.<br>**හෝ**<br>2. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඉහත සඳහන් තාක්ෂණවේදී සහතිකපත්‍ර නිකුත් කරන අයතනයකින් අදහස් ලබා ගත් පසු ඉහත තාක්ෂණවේදී සුදුසුකම්වලට සියලුම ආකාරයෙන්ම සමානකමක් ඇති බවට තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව |

| | | | |
|---|---|---|---|
| | | අපොස (උ/පෙ) විභාගයෙන් ගණිතය විෂයමාලාවෙන් ශුද්ධ ගණිතය/ ව්‍යවහාරික ගණිතය/ සමාන්තර ගණිතය සමඟ භෞතික විද්‍යාව යන විෂයයන් ඇතුළුව විෂයන් තුනක් එකවර සමත්වී තිබිය යුතුයි | විසින් අනුමත කරන වෙනත් සුදුසුකම්. |